සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

| | | |
|---|---|---|
| චිත්‍ර | II | පැය දෙකයි |
| சித்திரம் | II | இரண்டு மணித்தியாலம் |
| Art | II | *Two hours* |

**සැලකිය යුතුයි :**

* ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** දී ඇති තීරුවේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ භාවිත කළ හැකි ය.
* සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

* ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

 **1.** රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.

 **2.** ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ කඩදාසිය භාවිත කරන්න.

* **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

* ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**

 **1.** මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

- **වර්ණ චිත්‍රය**

 **2.** ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම

 **3.** පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය

 **4.** දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම

 **5.** වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා

 **6.** උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

**සැලකිය යුතුයි:**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නො වේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**සැලකිය යුතුයි :**

- ※ ඔබ ඇඳිය යුත්තේ **එක** චිත්‍රයක් පමණි.
- ※ ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** දී ඇති තීරුවේ පැහැදිලි ව ලියන්න.
- ※ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ※ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
- ※ ඇඳීමේ සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. වැල්ලේ ධීවරයෝ
2. මහ මග පදික වෙළෙඳපොළක්
3. දොළක දිය නාන ළඳුන්
4. අලි රැළක් දුටු සංචාරක පිරිසක්

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

5. බිත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක අඟල් **9 × 9** ප්‍රමාණයේ කොටසක් පස්පෙති මලක් හා කොළයක් ඇසුරෙන් නිර්මාණය කරන්න. ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.
6. ඒක කේන්ද්‍රීය ව විහිදී යන පැති අටක් වූ කුඩා රෙද්දක් අලංකාර කිරීම සඳහා විසිතුරු මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. වෘත්තාකාර පිත්තල බන්දේසියක් කැටයම් කිරීම සඳහා පාරම්පරික මෝස්තර භාවිතයෙන් සැරසිල්ලක් නිර්මාණය කරන්න.

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර**

8. 'හඳයා' නමින් වූ ළමා පොතක් සඳහා පිටකවරයක් සැලසුම් කරන්න.
9. 'ඩෙංගු මර්දනය කරමු' මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පාසලේ වාර්ෂික චිත්‍ර ප්‍රදර්ශනය සඳහා විචිත්‍රවත් ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

※※※

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....